## සංක්ෂිප්තය

දැනුම් සම්භාරයක් පෙරදැරි ව ක්‍රියාත්මක වන විභාග කේන්ද්‍රීය බව හා තරඟකාරී බව පෙරමුණ ගත් ඉගෙනුම් ඉගැන්වීම් ක්‍රියාවලියේ දී දරුවන් තුළ යහ චර්යාවන් වර්ධනයට යොමු කෙරෙන අවධානය ප්‍රමාණවත් නොවීමේ ප්‍රතිඵලය ලෙස ශිෂ්‍යයින්ගේ විනය ගැටලු ආක්‍රමණශීලී චර්යා රටාවන් පාසල තුළ දිනෙන් දින වැඩිවෙමින් පවතියි. මේ හේතුවෙන් ශිෂ්‍යයන් තුළ මානවීය ගුණධර්ම, යහචර්යාවන් සහ මෘදු ගුණාංග ප්‍රවර්ධනය කිරීමට පාසල් තුළ සක්‍රියව ක්‍රියාත්මක වන මාර්ගෝපදේශන හා උපදේශන වැඩසටහනක අවශ්‍යතාව පවතියි. මෙම පසුබිම තුළ මගින් ශ්‍රී ලංකාවේ රජයේ පාසල්වල ක්‍රියාත්මක වන මාර්ගෝපදේශන හා උපදේශන ක්‍රියාවලියේ සාර්ථකත්වය අධ්‍යයනය කිරීම මෙම පර්යේෂණයේ ප්‍රධාන ප්‍රස්තූතය වේ. ඒ අනුව, පාසල් උපදේශන හා මාර්ගෝපදේශන වැඩසූටහනක අවශ්‍යතාව හඳුනා ගැනීම, පාසල් උපදේශන හා මාර්ගෝපදේශන වැඩසටහන් ක්‍රියාත්මක වන ආකාරය හඳුනා ගැනීම, උපදේශන හා මාර්ගෝපදේශන ක්‍රියාවලියේ දී පාසල මුහුණ දෙන අභියෝග හඳුනා ගැනීම සහ අභියෝග ජය ගැනීම සඳහා පාසල් මට්ටමින් ගත හැකි ක්‍රියාමාර්ග යෝජනා කිරීම යන අරමුණු ඔස්සේ මෙම අධ්‍යයනය සිදු කරන ලදි. අධ්‍යයනයේ පර්යේෂණ ක්‍රමය ලෙස විස්තරාත්මක පර්යේෂණ ප්‍රවේශය යටතේ පවතින සමීක්ෂණ පිරිසැලසුම භාවිත කළ අතර පර්යේෂණ අරමුණු සාක්ෂාත් කර ගැනීම පිණිස නියැදිකරණ ක්‍රම ශිල්ප භාවිත කරමින් නියැදිය සහ දත්ත රැස් කරන ක්‍රම ශිල්ප සහ උපකරණ යොදා ගන්නා ලදි. වැල්ලවාය අධ්‍යාපන කලාපයේ පාසල් 10ක් පාසල් නියැදිය ලෙස යොදා ගත් අතර විදුහල්පතිවරු, නියෝජ්‍ය විදුහල්පතිවරු, උපදේශන ගුරුවරුන් සහ පන්තිභාර ගුරුවරුන් 10 බැගින් ද සිසුන් 100 ක් ද ලෙස බහුවිධ නියැදි දත්ත රැස් කිරීමට භාවිතා විය. විදුහල්පතිවරුන්ගෙන් සම්මුඛ සාකච්ඡාවක් මගින් ද නියෝජ්‍ය විදුහල්පතිවරු, උපදේශන ගුරුවරුන් , පන්තිභාර ගුරුවරුන් ගෙන් සහ සිසුන්ගෙන් ප්‍රශ්නාවලි අනුසාරයෙන් ද දත්ත රැස් කළ අතර ලේඛන සමීක්ෂණ ද යොදා ගන්නා ලදි. රැස් කළ තොරතුරු ප්‍රමාණාත්මක ව සහ ගුණාත්මක ව විශ්ලේෂණය කර ප්‍රතිශත, වගු ප්‍රස්තාර සහ සරල සංඛ්‍යාන ක්‍රම යොදා ගනිමින් අර්ථකථනය කරන ලදි. පර්යේෂණයට අදාළ සාහිත්‍ය විමර්ශනය න්‍යායාත්මක සහ ආනුභවික වශයෙන් ද සිදු කෙරිණ. න්‍යායාත්මක විමර්ශනයේ දී මාර්ගෝපදේශන හා උපදේශන ක්‍රියාවලිය පිළිබඳ වන න්‍යායයන්ගේ වන සංකල්ප සහ උපදේශන ක්‍රියාවලියට ඒවායේ අදාළත්වය පිළිබඳ සාකච්ඡා කළ අතර ආනුභවික සාහිත්‍ය විමර්ශනය මගින් ශිෂ්‍ය ගැටලු අවම කර ගැනීමට උපදේශන සේවාවකින් ලද හැකි සහය, උපදේශන සේවයට යොමු වීම පිළිබඳ සිසුන්ගේ ආකල්ප, පාසල් උපදේශන ක්‍රියාවලියේ පවතින අභියෝග හා ගැටලු සහ පාසල් උපදේශන සේවාවේ සාර්ථක අසාර්ථකභාවය පිළිබඳව පර්යේෂකයන් සිදු කර ඇති අධ්‍යයන

සාකච්ඡාවට ලක් කරන ලදී. මෙම අධ්‍යයනයේ අනාවරණ පර්යේෂණ අරමුණුගත ව ඉදිරිපත් කරන ලදී. ඉගෙනුම් ක්‍රියාවලියේ සංවර්ධනයට මාර්ගෝපදේශන හා උපදේශන ක්‍රියාවලියේ අවශ්‍යතාව පවතින අතර විශේෂයෙන් එහිදී බාධාකාරී වන පවුලේ ,පාසලේ මෙන් ම ශිෂ්‍යයන්ට ඇතිවන පෞද්ගලික ගැටලු විසඳාගැනීමට පාසල් උපදේශනය අවශ්‍ය වේ. පාසල් උපදේශනය ක්‍රියාත්මක වන ආකාරය අනුව පාසල්වල උපදේශනයේ නිරත ගුරුවරුන් බහුතරයකගේ උපදේශන පුහුණුව ප්‍රමාණවත් නොවන අතර විදුහල්පතිවරුන්ගේ ද උපදේශනය හා සම්බන්ධ ආකල්ප ධනාත්මක නොවීම හේතුවෙන් ගුරුවරුන් වෙනත් රාජකාරීවල නිරත කරවීම හා සම්බන්ධ ගැටලු පවතියි. උපදේශන ක්‍රියාවලිය පාසල තුළ ක්‍රියාත්මක කිරීමේ දී පවතින ගැටලු ලෙස අඛණ්ඩ අධීක්ෂණ හා නියාමන වැඩපිළිවෙලක් නොමැතිකම, උපදේශන ගුරුවරුන්ගේ පුහුණුව අඩුකම හා උපදේශනයේ රහස්‍යභාව ආරක්ෂා නොවීම ප්‍රධාන ගැටලු ලෙස හඳුනා ගත හැකි විය. මෙම ගැටලු නිරාකරණයට විසඳුම් ලෙස විදුහල්පතිවරුන් උපදේශනය සම්බන්ධයෙන් දැනුවත් කිරීම, උපදේශන ගුරුවරුන්ගේ දැනුම යාවත්කාලීක කිරීම හා අවශ්‍ය පුහුණුව ලබාදීම මෙන් ම උපදේශන ක්‍රියාවලිය විධිමත් කිරීම සඳහා උපදේශනය හා අදාළ නීතිරීති හා රෙගුලාසි සහිත චක්‍රලේඛයක් කෙටුම් පත් කිරීම පිළිබඳ ව යෝජනා විය.

## Abstract

In a knowledge-based , exam-centered ,competitive education process , an increase of disciplinary issues and aggressive behavior patterns are visible among students due to lack of attention towards their behavior development. As a result , an active guidance and counseling program is in need within schools in order to uplift the morals , mannerism and benevolence in students. The main objective of this research is based on figuring out the success of the guidance and counseling process already operates in government schools in Sri Lanka. This research was carried out based on, to identify the need for a guidance and counseling program, to identify how guidance and counseling program operates in schools, to identify the challenges a school has to face during guidance and counseling process and to suggest actions to be taken in order to overcome the challenges on the school level. The survey layout under the detailed research approach has been used as the research method of this study while the sample through modeling methodologies , data collecting methodologies and equipments have been used in order to meet the research objectives. 10 schools in Wellawaya education zone have been used as the sample while principals , deputy principals , counseling teachers , 10 class teachers and 100 students have been used to collect multiple sample data. Data has been collected through an interview from principals and through questionnaire from deputy principals , counseling teachers , class teachers and students. Document surveys also have been used. After a quantitative and qualitative analysis, collected information was interpreted using percentages , table graphs and simple statistics. The literary review related to this research has been done theoretically and empirically. In the theoretical review , the concepts and the principles of guidance and counseling and their relevance to the counseling process have been discussed. Possible support of a counseling service to minimize students' problems , students' attitudes towards counseling, challenges and issues in the school counseling process and researchers' researches on the success and failure of counseling have been discussed in the empirical review. The outcomes of this study have been submitted based on researches. The development of the learning process requires

guidance and counseling program especially in solving problems in family , school and personal issues. In school counseling programs, majority of teachers do not have adequate counseling training and there are problems with teachers engaging in other duties due to the non-positive attitudes towards counseling. Lack of continuous monitoring and regulatory program,lack of training of counseling teachers and lack of confidentiality of counseling were identified as major problems of the counseling process in the schools. Making principals aware on counseling , updating the knowledge of counseling teachers and providing necessary training and also formalizing the counseling process and drafting a circular on relevant rules and regulations have been suggested as solutions for these problems.